din-08-07-uns-858P-27x3-pnf-1

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## 2026/2027 වර්ෂය සඳහා
## සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවා සැපයීම

### කොන්ත්‍රාත් අංකය : TRC/ADM/01/24/02/01

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ශ්‍රී ලංකාව, කොළඹ 8 , ඇල්විටිගල මාවත , අංක . 276 දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා 2026/2027 වර්ෂයට අදාළ වසරක කාලයක් වෙනුවෙන් සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාවන් ප්‍රසම්පාදනය කිරීම පිණිස යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

1. මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රමවේදය යටතේ සිදු කරනු ලබන අතර, ඒ සඳහා ශ්‍රී ලංකාවේ ලංසුකරුවන්ට පමණක් සහභාගී වීමට අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) විසින් කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276, හි පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, හන්තාන (මහනුවර) සහ කදිරාන (මීගමුව) හි පිහිටි සංඛ්‍යාත පිරික්සුම් මධ්‍යස්ථාන සහ කොකාවිල් හි පිහිටි රූපවාහිනී/විකාශන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය සඳහා වසරක කාලයක් සඳහා සනීපාරක්ෂක හා පිරිසිදු කිරීමේ සේවාවන් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

3. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට මෙම ප්‍රසම්පාදනයට අදාළ වැඩිදුර විස්තර කොළඹ 8 , ඇල්විටිගල මාවත , අංක . 276 , දරන ස්ථානයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශයේ අධ්‍යක්ෂ / පාලන හා ආයතනික කටයුතු වෙතින් හෝ 0112669789 අංකයට ඇමතීමෙන් ලබා ගත හැකිය. ලංසු ලේඛන 2026.08.11 සිට 2026.08.24 දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන අංශයේදී පරීක්ෂා කළ හැකිය.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.08.11 සිට 2026.08.24 දක්වා සතියේ රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා , රු. 5,000.00 ක ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තුවක් මුදලින් ගෙවා, කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276, පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ / පාලන සහ ආයතනික කටයුතු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

5. සියලුම ලංසු සමග ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරයේ වටිනාකම රු. 195,000.00 ක් විය යුතුය.

6. මුද්‍රා, තැබූ ලංසු, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"2026/2027 වසර සඳහා සනීපාරක්ෂක සහ පිරිසිදු කිරීමේ සේවා සැපයීම"** යනුවෙන් සඳහන් කර, 2026.08.25 දින ප.ව. 2.00 ට හෝ එදිනට පෙර පාලන සහ ආයතනික කටයුතු අංශය , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන සහ ආයතනික කටයුතු අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාළීම කළ හැකිය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, 2026.08.25 දින ප.ව. 2.00 ට පසුව, ලංසුකරුවන් හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. නියමිත අවසන් වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රමාද වූ ලංසු ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන සියලුම ලංසු පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතු වේ.

7. ලංසු ඉදිරිපත් කිරීමට පෙර පැවැත්වෙන පූර්ව ලංසුකරුවන්ගේ රැස්වීම 2026.08.18 දින පෙ.ව. 11.00 ට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේදී පැවැත්වේ.

**සභාපති ,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන ),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,**
**276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**

2026.08.10